**යටිනුවර ප්‍රාදේශීය සභාව - 2022**

-----------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

යටිනුවර ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට යටිනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණන සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරික්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

1.6.1 **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට බාහිර පාර්ශවයන් 17 ක් විසින් සභාව වෙත සහ සභාව විසින් බාහිර පාර්ශවයකට නඩු පවරා තිබුණු අතර, ඒ වෙනුවෙන් නඩු ගාස්තු වශයෙන් රු.283,500 ක වියදමක් දරා තිබුණ ද, ඒ පිළිබඳව තොරතුරු මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි. | 2023 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව | නඩු සම්බන්ධව තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය |

1.6.2 **ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට ලැබිය යුතු රු.8,168,219 ක ස්ථාවර තැන්පතු පොළී ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේ දී මෙම වරද නිවැරදි කරන බව | ලැබිය යුතු පොලී නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (ආ) | ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වැය කර තිබුණු රු.7,568,117 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | -එම- | ගොඩනැගිලි ඉදිකිරීමේ පිරිවැය ප්‍රාග්ධනිත කළ යුතුය |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළ දැන්වීම් පුවරු ආදායම රු.1,288,425 ක් වුවත්, එය රු.472,435 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන්, රු.815,990 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | අය විය යුතු හිඟ මුදල් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කරන බව | ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අත්හැර දමා තිබුණු රු.416,500 ක ව්‍යාපෘති 02 ක් ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේ දි කළමනාකරණ කමිටුව මඟින් අනුමැතිය ලබා ගෙන කපා හැරීමට කටයුතු කරනු ලබන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ජංගම ගිණුමේ මුදල් පොත අනුව ශේෂය රු.65,976,479 ක් වුවත්, එය ශේෂ පත්‍රයේ | 2023 වර්ෂයේ නිවැරදි කර ඇති බව | මුදල් ශේෂය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| | රු.66,671,689 ක් ලෙස දක්වා තිබීමෙන් රු.695,210 ක් වැඩියෙන් දක්වා තිබුණි. | | |
| (ඊ) | සමාලෝචිත වර්ෂය තුළ පරිත්‍යාග ලෙස ලැබී තිබුණු එකතුව රු.267,729 ක ලී පොත් රාක්ක සහ පුස්තකාල පොත් ප්‍රාග්ධන ආදායම් සහ වියදම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම් සැකසීමේ දී නිවැරදි කරන බව | පරිත්‍යාග ආදායම් හා වියදම් ලෙස ගිණුම්ගත යුතුය |

1.6.3 **නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| **විෂයය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.17,707,718 ක වත්කම් විෂයන් 02 ක් හා වගකීම් විෂයකට අදාළ මූලික පොත්වල ශේෂයන්ගේ එකතුව රු.17,560,639 ක් වූයෙන්, රු.748,579 ක නොසැසඳීමක් විය. | 2023 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමට පෙර මෙම වෙනස්කම් හඳුනා ගෙන නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කරන බව | වෙනස්කම් හඳුනා ගෙන ගිණුම් නිවැරදි කළ යුතුය |

1.6.4 **විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.4,149,176 ක් වූ ගිණුම් ශේෂ 03 ක්, උපලේඛන සහ අදාළ ලිපි ගොනු ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | 2023 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේ දී නිවැරදිව තොරතුරු ඇතුළත් කර ගිණුම් සකස් කිරීමට පියවර ගන්නා බව | උපලේඛන නිවැරදිව පිළියෙල කළ යුතුය |

1.7 **අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 149 වගන්තිය | බල ප්‍රදේශය තුළ සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටලයකින් සියයට 01 ගාස්තුව රු.7,069,651 ක් අය කර නොතිබුණු අතර, එක් හෝටලයකින් විගණනය කරන ලද ගිණුම් කට්ටලය ලබා නොගෙන ගාස්තු අය කර තිබුණි. | 2023 වර්ෂය සඳහා මුදල් අය කිරීමේ දී නිවැරදි ගිණුම් වාර්තා ලබා ගැනීමටත්, ආදායම් විස්තර වෙන වෙනම ලබා ගැනීමටත් කටයුතු කරන බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1978 අංක 41 දරන නාගරික සංවර්ධන පනත හා 1996 අගෝස්තු 06 දිනැති අංක 935(6) දරන ගැසට් පත්‍රය | 2018 වර්ෂයේ දී, අක්කර 05 පර්චස් 17.09 ක අනුබෙදුම් ඉඩමෙන් සභාවට පොදු කටයුතු සඳහා ලැබිය යුතු ඉඩම් ප්‍රමාණය පර්චස් 65.05 ක් වුවත්, පර්චස් 35.07 ක ඉඩම් ප්‍රමාණයක් ලබා ගෙන ඉතිරි පර්චස් 29.9ක ඉඩම් කොටස සඳහා පනතේ විධිවිධානවලට පරිබාහිරව කටයුතු කර මුදල් ලබා ගෙන තිබුණි. | අයදුම්කරුගේ ලිඛිත ඉල්ලීම සලකා බලා පර්චස් 35.7 ක ඉඩම් පවරා ගැනීමටත්, ඉතිරි පර්චස් 29.9 සඳහා සියයට 10 ක ප්‍රමාණය ගණනය කර මුදල් ප්‍රාදේශීය සභාවේ තැන්පත් කිරීමටත් නිර්දේශ කර ඇති බව | පනතේ විධිවිධාන හා චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය |
| (ඇ) | 1988 අගෝස්තු 23 දිනැති අංක 520/07 දරන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වගන්තිය | දැන්වීම් පුවරු සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කර නොතිබුණු අතර, දැන්වීම් පුවරු 76 කින් රු.217,750 ක ගාස්තු අය කර නොතිබුණි. | 2023 වර්ෂයේ දී මෙම හිඟ ගාස්තු ද සමඟ අය කර ගැනීමට කටයුතු කරන බව | වාර්ෂිකව සමීක්ෂණය කර ගාස්තු කාලීනව අය කර ගත යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.64,033,946 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.65,403,743 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම රු. | බිල් කළ ආදායම රු. | රැස් කළ ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. | ඇස්තමේන්තුගත ආදායම රු. | බිල් කළ ආදායම රු. | රැස් කළ ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. |
| (i) | වරිපනම් හා බදු | 3,467,800 | 3,714,234 | 3,508,330 | 4,895,528 | 5,721,800 | 5,623,325 | 3,188,908 | 4,689,134 |
| (ii) | කුලී | 1,300,000 | 1,051,100 | 269,170 | 785,430 | 1,542,060 | 387,360 | 301,335 | 3,500 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,548,000 | 2,170,513 | 2,170,513 | -- | 1,888,000 | 1,687,714 | 1,782,515 | -- |
| (iv) | වෙනත් ආදායම් | 85,350,200 | 87,245,363 | 81,142,699 | 97,489,632 | 85,888,700 | 87,749,495 | 417,684 | 91,386,968 |
| | එකතුව | 92,666,000 | 94,181,210 | 87,090,712 | 103,170,590 | 95,040,560 | 95,477,894 | 5,690,442 | 96,079,602 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමස්ත ආදායම් ප්‍රභවයන්ගෙන් 2021 දෙසැම්බර් 31 දිනට පැවති හිඟය රු.96,079,602 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට එම වටිනාකම රු.103,170,100 ක් වීම හේතුවෙන්, හිඟ ආදායම් සියයට 07 කින් ඉහළ ගොස් තිබුණි. | 2023 වර්ෂයේ ආදායම් රැස් කිරීමේ සැලැස්මක් සකස් කර සැලකිය යුතු ආදායම් රැස් කිරීමේ ප්‍රතිශතයක් පෙන්නුම් කිරීමට කටයුතු කරනු ලබන බව | හිඟ ආදායම් අය කර ගත යුතුය |
| (ආ) | **වරිපනම්**<br>වරිපනම් ඒකකයක හිඟය රු.5,000 ත් රු.10,000 ත් අතර වරිපනම් දේපළ 103 කින් එකතුව රු.674,774 ක් ද, රු.10,000 ත් රු.50,000 ත් අතර වරිපනම් දේපළ 29 කින් රු.535,877 ක් ද, රු.50,000 ට වැඩි වරිපනම් දේපළ 06 කින් එකතුව රු.467,064 ක මුදලක් ද වරිපනම් හිඟව පැවතුණි. | වරිපනම් හිඟ ශේෂයන් කඩිනමින් අය කර ගැනීමට කටයුතු සැලැසුම් කර ඇති බව | හිඟ වරිපනම් බදු අය කර ගත යුතුය |
| (ඇ) | **ජල බදු**<br>සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ජල ගාස්තු ආදායම රු.621,723 ක් වූ අතර, එහි අවුරුදු 01 ත් 05 ත් අතර කාලයට අදාළ ලැබිය යුතු ජල ගාස්තු ආදායම රු.575,116 ක් විය. | පාරිභෝගිකයින් දැනුවත් කිරීමට පියවර ගෙන ජල සම්බන්ධතා විසන්ධි කිරීමේ නිවේදන යැවීමට කටයුතු කරන බව | හිඟ ජල ආදායම් අය කළ යුතුය |
| (ඈ) | **කුලී**<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කඩ කුලී එකතුව රු.785,430 ක් වූ අතර, එහි අවුරුදු 01 ත් 05 ත් අතර හිඟ කඩ කුලී රු.231,000 ක් විය. | ගෙවීම් පැහැර හරින කඩ කුලී හිමියන් සඳහා නීත්‍යානුකූලව කටයුතු කරන බව | කඩ කුලී කාලීනව අය කළ යුතුය |
| (ඉ) | **ත්‍රී රෝද ගාස්තු**<br>ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචි ත්‍රී රෝද රථ පොළවල් 42 ක මුළු ලියාපදිංචි රථ සංඛ්‍යාව 509 ක් විය. ඉන් 2021 හා 2022 වර්ෂ සඳහා ත්‍රීරෝද රථ 215 ක් හා 309 ක් සඳහා බලපත්‍ර නිකුත් නොකිරීම හේතුවෙන්, රු.419,200 ක ආදායමක් අහිමි වී තිබුණි. | ත්‍රී රෝද රථ නැවතුම් පොළවල් ආවරණය වන පරිදි දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළ අතර, එහිදි ලිඛිතව හා වාචිකව බලපත්‍ර ලබා ගැනීම සම්බන්ධයෙන් දැනුවත් කරන බව | හිඟ ත්‍රීරෝද රථ ගාස්තු අය කළ යුතුය |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.2,701,869 ක් හා මුද්දර ගාස්තු රු.94,162,308 ක් විය. | මෙම ගාස්තු 2023 වර්ෂයේ දී අය කර ගැනීමට කටයුතු කරන බව | උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත්, 2022 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු කාරණාවක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් තවදුරටත් සොයා බලා එම අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කරන බව | කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය අතුරු ව්‍යවස්ථා පනවා ගත යුතුය |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ සභා අරමුදල් උපයෝජනය කර ඉටු කිරීමට ඇස්තමේන්තු කර තිබුණු රු.1,249,377 ක ව්‍යාපෘති 04 ක් ඉටු කර නොතිබුණි. | මෙම ව්‍යාපෘති ගිවිසුම්ගත වූ නමුත්, ඇති වූ විවිධ ගැටළු හේතුවෙන් මේ වන විට නතර කර ඇති බව | සැලසුම්ගත කාර්යයන් ඉටු කළ යුතුය |
| (ඇ) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජල ව්‍යාපෘති 06 ක් ක්‍රියාත්මක අතර, එම ව්‍යාපෘතිවල 2022 වර්ෂය සඳහා ජල සාම්පල් පරීක්ෂාවේ දී, SLS 614/2013 අනුව තිබිය යුතු ප්‍රමිති තත්ත්වය නොමැතිවීම හේතුවෙන් ජල පාරිභෝගිකයින්ට පිරිසිදු ජලය ලබා දීමට සභාව අපොහොසත් වී තිබුණි. | ජල සාම්පල පරීක්ෂා කළ පසු ලබා දෙන උපදෙස් පරිදි ඉදිරියේ දී කටයුතු කරන බව | පිරිසිදු පානීය ජලය නිකුත් කිරීමට කටයුතු කළ යුතුය |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2008 පෙබරවාරි 25 දිනැති අංක 1533/16 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද 1980 අංක 47 දරන ජාතික පරිසර පනතේ විධිවිධාන ප්‍රකාරව, කාලය ඉකුත් වූ පරිසර ආරක්ෂණ බලපත්‍ර 109 ක් අලුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත් වූ පරිසර ආරක්ෂණ බලපත්‍ර සියල්ල සඳහා අලුත් කර ගැනීමට ලිපි යවා ඇති අතර, සමහර බලපත්‍ර සඳහා අවසන් නිවේදනයන් ද නිකුත් කර ඇති බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ආ) | **ලැබිය යුතු ගිණුම්**<br>සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතුව රු.5,604,065 ක් විය. ඉන් වසර 01 ත් වසර 05 ත් අතර කාල පරාසයක එකතුව රු.2,454,484 ක් හා වසර 05 ක කාලයක් ඉක්මවා තිබුණු ගිණුම් ශේෂවල වටිනාකම රු.3,043,007 ක් විය. | ලැබිය යුතු ගිණුම් පිළිබඳව අවධානය යොමු කර අය කර ගැනීමට කටයුතු කරන බව | ලැබිය යුතු ගිණුම් ශේෂ අය කර ගත යුතුය |
| (ඇ) | **ගෙවිය යුතු ගිණුම්**<br>සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති ණයහිමි ශේෂ 02 ක එකතුව රු.70,651,884 ක් විය. ඉන් වසර 01 ත් වසර 05 ත් අතර කාල පරාසයක එකතුව රු.12,038,848 ක් හා වසර 05 ක කාලයක් ඉක්මවා තිබුණු ශේෂවල එකතුව රු.5,863,536 ක් විය. | තොරතුරු නිවැරදිව සොයා බලා 2023 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේ දී නිවැරදි කරන බව | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කළ යුතුය |

## 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **සභාව සතු වත්කම් පරීක්ෂාව**<br>සභාව පරිහරණය කරන ඉඩම් 39 ක අයිතිය තහවුරු කිරීමට අවශ්‍ය ඔප්පු හෝ පැවරුම් නියෝග ලබා ගෙන නොතිබුණි. එසේම, ඔප්පුවේ සඳහන් ප්‍රමාණයන් හා මායිම් නිරවුල් කර ගැනීමට හා පිඹුරුපත් සකස් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් කිහිපයක් පවරා ගැනීමේ කටයුතු දැනට සිදු කරමින් පවතින බව | සභාව සතු ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගත යුතුය |
| (ආ) | **වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම**<br>පරිත්‍යාග ලෙස ලැබී තිබුණු පර්චස් 06 ක විල්අමුණ අම්බලම නමැති ඉඩම හා ගොඩනැගිල්ල මහනුවර - කොළඹ ප්‍රධාන මාර්ගයට මායිම්ව පිහිටි වටිනාකමින් වැඩි දේපළක් වන අතර, එහි අයිතිය තහවුරු කරන කිසිදු ලියවිල්ලක් විගණන කටයුතු සඳහා ඉදිරිපත් නොකෙරුණි. එසේම, මෙම ඉඩම හා ගොඩනැගිල්ල වාණිජමය කටයුත්තකට හෝ වෙනත් ඵලදායි කාර්යයකට යොදා ගෙන නොතිබුණි. | මෙම ඉඩමේ අයිතිය තහවුරු කරන මුල් ලිපි සොයා ගැනීමට නොහැක. මෙම ගොඩනැගිල්ල 2016 වර්ෂයේ සිට වසර 02 ක් පමණ නොදිරන කසල එකතු කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස පවත්වා ගෙන ගිය අතර, වැඩිහිටි සුරකුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට යෝජනා කර ඇති බව | ඉඩම්වල අයිතිය තහවුරු කර වත්කම් උපයෝජනය කළ යුතුය |

(ඇ) **පවරා නොගත් වත්කම්**

| | | | |
|---|---|---|---|
| (i) | අක්කර 02 ක කිරිමැටිය කසළ අංගනය පිහිටි ඉඩම් අත්පත් කර ගැනීම සඳහා රු.2,600,000 ක් 2020 ජනවාරි 22 දින යටිනුවර ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවා තිබුණ ද, ඉඩමේ අයිතිය සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | මෙම ඉඩම අත්පත් කර ගැනීමට අදාළ සියලු ගෙවීම් සිදු කර ඇතත්, වැවිළි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ගේ එකඟතාවය මේ වන තෙක් ලැබී නොමැති බව | වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය |
| (ii) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් වත්කම් 04 ක් පවරා ගැනීමට රු.119,000 ක වියදමක් දරා ඇතත්, පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණු ට්‍රැක්ටරයක අයිතිය සභාවට පවරා ගෙන නොතිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා පවරා ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතින බවත්, මෙම ට්‍රැක්ටරය පවරා ගැනීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත සියලු ලියකියවිලි යවා ඇති බව | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය |

(ඇ) **නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්**

| | | |
|---|---|---|
| එකතුව රු.17,363,377 ක වාහන 07 ක් නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි. | වාහන 03 ක් නිෂ්කාර්යයව පවතින බැවින්, අවශ්‍යතාවය ඇති ආයතනවලට ලබා දීමේ වැඩපිළිවෙලක් සකස් කරමින් පවතින බවත්, වාහන 03 ක් අලුත්වැඩියා කිරීමට කටයුතු කරමින් පවතින අතර, වාහනයක් ඉවත් කිරීමට කටයුතු කරන බව | අදාළ ක්‍රියාමාර්ග කඩිනමින් අවසන් කළ යුතුය |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **පොත්තපිටිය පුස්තකාලයේ වහලය ඉදිකිරීම - රු.936,216** | | |
| i | වැඩ විෂයය අංක 02 හි වහලයට ඇස්බැස්ටෝස් සෙවිලි තහඩු සපයා සවි කිරීම භෞතික පරීක්ෂාවට අනුව, වර්ග මීටර් 102.88 ක් සඳහා රු.212,447 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර, වැඩ විෂයය අංක 01 යටතේ පැරණි වහලය ඉවත් කිරීම සඳහා වර්ග මීටර් 102.88 ක් සඳහා රු.12,860 ක් වැඩිපුර ගෙවා තිබුණි. | අදාළ සමිතිය දැනුවත් කිරීමෙන් පසු වැඩිපුර ගෙවූ රු.235,630 ක මුදල සභාව වෙත මුදලින් ගෙවීමට එකඟ වී ඇත | ඉටු නොකළ වැඩ සඳහා ගෙවීම් නිර්දේශ කළ නිලධාරීන් හඳුනා ගෙන ක්‍රියාමාර්ග ගත යුතුය |
| ii | වැඩ විෂයය 07 යටතේ ජලය බැස යන නළ (Down Pipe) 02 ක් සඳහා රු.10,323 ක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි. | | |

| | | | |
|---|---|---|---|
| (ආ) | **ගන්නෝරුව ආයුර්වේද මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම - රු.2,272,708** | | |
| i | වැඩ විෂයය අංක 05 තලාදය සඳහා සැටලිමෙහි (Slab Beam Formwork) භෞතිකව මිනුම් අනුව, වර්ග මීටර් 5.34 ක් සඳහා රු.24,525 ක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණු අතර, Slab Formwork යටතේ වර්ග මීටර් 14.36 ක් සඳහා රු.29,926 ක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවා ඇති මුදල වන රු.207,176 ක මුදල රඳවුම් මුදල් ගෙවීමේ දී අඩුකර ගැනීම සඳහා අදාළ කොන්ත්‍රාත් සමිතිය සමඟ සාකච්ඡා කළ අතර, ඔවුන් ඒ සඳහා එකඟතාවය ලිඛිතව ලබා දී ඇති බව | ඉටු කළ වැඩ සඳහා පම ගෙවීම් නිර්දේශ කළ යුතු අතර, ගෙවීම් නිර්දේශ කළ නිලධාරීන් හඳුනා ගෙන ක්‍රියාමාර්ග ගත යුතුය |
| ii | කොන්ක්‍රීට් තට්ටුව (Slab) සඳහා දිගින් මීටර් 4.25 ක කම්බි 12 ක් සහ දිගින් මීටර් 2.3 ක වූ කම්බි 04 ක් වැඩිපුර ගණනය කර කොන්ත්‍රාත්කරුට රු.35,308 ක් වැඩිපුර ගෙවා තිබුණි. එසේම බිල්පත්‍රයේ වැඩ විෂයය අංක 03 අනුව භෞතිකව හඳුනා ගැනීමට නොහැකි වූ දඟර වානේ කම්බි කි.ග්‍රෑ.150 ක් සඳහා රු.141,900 ක් වැඩිපුර ගෙවා තිබුණි. ගොඩනැගිල්ලේ පඩි පෙළ සඳහා දඟර වානේ කම්බි (Reinforcement) කි.ග්‍රෑ.136.15 ක් යොදා තිබුණු බව භෞතිකව හඳුනා ගැනීමකින් තොරව රු.128,798 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. | | |